**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය - 2013**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනත හා 1996 අංක 32 දරණ සංශෝධිත පනතේ 25(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස නියෝජිතායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් නියෝජිතායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි .

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

බෝට්ටු හා යාත්‍රා වෙනුවෙන් දරන ලද අයහාර ස්වාභාවයේ වියදමක් ඉකුත් වර්ෂයේ ප්‍රාග්ධනිත කර ඒ වෙනුවෙන් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කළ මුදල නිවැරදි කළ නමුත් අධි ක්ෂය වෙන්කිරීම් රු.514,234 ක් නිවැරදි කර නොතිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී අයවීමට ඇති ණය ශේෂයන්වල වටිනාකම රු.26,132,204 ක් වූ අතර වර්ෂ 03 කට වඩා පැරණි ණය ශේෂයන්වල වටිනාකම රු.2,728,665 ක් වී තිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ණයහිමි කාල විශ්ලේෂණය අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී ගෙවීමට ඇති ණය ශේෂයන්වල වටිනාකම රු.16,852,620 ක් වූ අතර වර්ෂයකට වඩා පැරණි ණය ශේෂයන්වල වටිනාකම රු.244,593 ක් වී තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති සහ රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1996 අංක 32 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතන පනත (සංශෝධන) | පනතේ සඳහන් අරමුණුවලින් බැහැරව මත්ස්‍ය වෙළඳසැලක් ඉදිකිරීම සඳහා රු.7,916,832 ක් වැය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>----------------- | |
| | (i) මුදල් රෙගුලාසි 371 (2) | ලබාගත් අත්තිකාරම් අදාල කාර්යය අවසන් වූ විගස නිරවුල් කළ යුතු වුවද අවස්ථා 14 කදී ලබාගෙන තිබූ එකතුව රු.213,243 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 454 හා 751 | සියළුම භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයක ඇතුළත් කළ යුතු වුවද, ගබඩාවේ එවැනි ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.මිලියන 1,278 ක් වූ ස්ථාවර වත්කම් සඳහා වූ ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඈ) | 2003 අප්‍රේල් 10 දිනැති අංක 28 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උපදේශක ගාස්තු රු.650,000 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | වටිනාකම රු.7,013,457 ක් වූ පරිගණක හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් වූ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.120,061,820 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.93,909,305 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.26,152,515 ක ඌනතාවයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් වැටුප්, ගමන් වියදම්, ගිවිසුම්ගත සේවා හා පර්යේෂණ හා සංවර්ධන වියදම්වල වැඩිවීම හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**4.1 කාර්යසාධනය**

---------------

2009 සිට 2013 දක්වා පර්යේෂණ හා සංවර්ධන වියදම් වෙනුවෙන් ලද ප්‍රදාන වල මුළු එකතුව රු.මිලියන 1,334 ක් වී තිබුණු අතර ඒ සඳහා දරන ලද වියදම් වල මුළු එකතුව රු.මිලියන 242 ක් වී තිබුණි. ඒ අනුව පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා ලද ප්‍රදාන වලින් දරන ලද වියදම සියයට 18 ක් වී තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස ලද මුදල් වලින් රු.20,027,819 ක් එම කටයුතු සඳහා වැය නොකර සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වැයකර තිබුණි.

(ආ) වෙරළාසන්න කලාපයේ පර්යේෂණ කටයුතු සඳහා යොදවා ගතහැකි වන පරිදි රු.15,685,633 ක වියදමකින් නිෂ්පාදනය කර ඇති යාත්‍රාව මෙතෙක් පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කර නොතිබූ අතර යාත්‍රාවේ නියුතු නිලධාරීන් වෙනුවෙන් වැටුප්, අතිකාල දීමනා හා ආරක්ෂක කටයුතු ලෙස රු.4,427,117 ක් ගෙවා තිබුණි.

(ඇ) වැටුප්, ගමන් වියදම්, සුළු මුදල් හා විශේෂ මුදල් අත්තිකාරම් වශයෙන් රු.333,891 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තක්සේරු වටිනාකම රු.5,750,000 ක් වූ මෝටර් වාහන 04 ක් වර්ෂයකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ආයතන පරිශ්‍රය තුළ නිෂ්ක්‍රීයව පැවතුනි.

(ආ) 2009 වර්ෂයේදී රු.272,160 ක් වැයකර මෘදුකාංගයක් මිලදී ගෙන තිබූ අතර එම මෘදුකාංගය මේ දක්වා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) යෝජිත භෝජන ශාලාවක් ඉදිකිරීම සඳහා රු.855,938 ක් වැයකර තිබූ නමුත් මෙම ඉදිකිරීම වසර දෙකකට වැඩි කාලයක සිට අත්හැර දමා තිබුණි.

(ඈ) නිසි ඇගයීමකින් තොරව මිලදීගෙන තිබූ වටිනාකම රු.4,493,052 ක (HP 200) බෝට්ටු ඇන්ජින් දෙකක් වසර දෙකකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්වල ව්‍යාපෘති ආරම්භ කිරීම

බේරුවල නගර ආසන්නයේ ඉඩමක මත්ස්‍ය අලෙවි සැලක් හා සමුද්‍රීය නිරීක්ෂණ හා සුනාමි මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වටිනාකම රු.14,502,760 ක ගිවිසුම්වලට එළඹ, සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා රු.6,532,047 ක් වැය කර තිබූ නමුත් එම ඉඩම නියෝජිතායතනය වෙත විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 443 ක් හා 308 ක් වූ අතර පුරප්පාඩු සේවක සංඛ්‍යාව 122 ක් විය.

**4.6 ආර්ථික නොවන ගණුදෙනු**

පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට ඉදිකර ඇති පිරිවැය රු.3,329,908 ක් වූ යාත්‍රා දෙකක් නිසි ප්‍රමිතියකින් යුතුව ඉදිකර නොමැති බැවින් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබූ අතර එම වටිනාකම කෙරීගෙන යන වැඩ ලෙස ජංගම නොවන වත්කම් යටතේ තවදුරටත් දක්වා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණනය පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනයේ රාජකාරී කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබූ අතර, ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු කරගෙන යාම සඳහා සහායක නිලධාරී තනතුරු ඇතුළත්වන ආකාරයට කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩලයේ ඌණතාවය හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයේ කටුයුතු අවශ්‍යතාවය අනුව සැලසුම් කිරීමට හා පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සංඛ්‍යා හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියෝජිතායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුව ඇත.

(අ) අයවැය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) මානව සම්පත් කළමනාකරණය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ගිණුම්කරණය
(ඊ) අත්තිකාරම්